# "මහ කන්නය" සඳහා වූ නැකැත්

පෘථුවිය නම් වූ අසිරිමත් ග්‍රහලෝකය වූලනී චක්‍රාවාටය නම් වූ මංදකිණියේ දහස් ගණන් සූර්යයන් අතුරින් එක් සූර්යයෙක් වටා පරිභ්‍රමණය වන ග්‍රහ ලෝකයන්ගෙන් තුන්වන ග්‍රහලෝකයයි. මුළු චක්‍රාවාටයෙහිම මෙම ග්‍රහලෝකයේ පමණක් ජීවීන් ඇතැයි විශ්වාස කෙරෙන අතර එම ජීවීන් අතර ශාක සහ සත්ත්ව ලෙස ජීවීන් කෝටි ගණනකි.

මෙම ජීවීන්ට ජීවය හා ශක්තිය සපයනු ලබන්නේ රවි ග්‍රහයා නොහොත් සූර්යයාය. ජ්‍යොතීශයේ හැඳින්වෙන රවි යනු හිරු හෙවත් සූර්යයා යනුවෙනි. මෙම රවි ග්‍රහයා සතු ෂඩ් වර්ණයට (වර්ණ හයකි) සංවේදී වූ ශාක එම ශක්තිය සෘජුව ලබා ගැනීමට එක්තරා කාල සටහනකට අනුව පැලවීමත්, මල් පිපීමට සහ ගෙඩි සෑදීමටත් හුරු වී සිටී. මෙය 'කල්යල් බැලීම' ලෙස හැඳින් වේ. මෙම ක්‍රියාවලියට ගැළපෙන ලෙස ගොවිතැන් කිරීම කල් යල් බලා ගොවිතැන් කිරීමකි.

ඒ අනුව, ශ්‍රී ලංකාවේ මාර්තු - අප්‍රේල් 'යල' ලෙසටත් සැප්තැම්බර් ඔක්තෝබර් 'මහ' ලෙසටත් සලකා වී වැපිරීමටත් බීජ සිටුවීමටත් පැරැන්නනෝ වග බලා ගත්හ. මීට අමතරව මෙම ෂඩ් වර්ණයට චන්ද්‍රයා ඇතුළු අනෙකුත් ග්‍රහයන් මතට පතිත වී නාභිගත කර, පෘතුවියට පරාවර්තනය වීම ගැන සලකා ඒවා යෝග සහ සංයෝග ලෙසත්, ග්‍රාහක වළල්ල චන්ද්‍රයාගේ තිරී ලෙස හඳුන්වන අංශක 12.5 හේ කෝණවලට චන්ද්‍රයා පැමිණි එම වර්ණ ඒකරාශී කර පෘථිවියට නාභිගත කිරීම 'නැකැත්' ලෙසත් නම් කොට එය ශාකවල වර්ධනයට බලපාන ආකාරය හොඳින් වටහා ගත් පැරැන්නනෝ ඉන් ප්‍රයෝජන ගත්හ.

මහ කන්නයට අදළ නැකැත් පහත වගුවේ සඳහන් කොට ඇත.

**මහ කන්නය සඳහා-2009 වසර සඳහා නැකැත්**

- මාස පහේ (05) වී වපුරන්නේ නම් ජනවාරි මස 10 වන දිනට පිදීම සඳහා සැප්තැම්බර් (බිනර) මස 11 වන දින පෙ.ව. 06.02. - පෙ.ව 06.14 දක්වා වූ නැකත ගත යුතු ය.
- මාස හතරහමාරේ (4 1/2) වී වපුරන්නේ නම් සැප්තැම්බර් (වප්) මස 23 දින මධ්‍යහ්න 12.16 - 12.32 නැකත ගත යුතු ය.
- මාස හතරහමාරේ (4 1/2) වී වෙනත් නැකැත් ද තිබේ. එය ඔක්තෝබර් (වප්) මස පෙ.ව. 05.58 - පෙ.ව. 06.10 අතර නැකත වේ.

| මාසය | දිනය | දවස | වේලාව | කාරණය | සුභ දිශාව | කරණය | හෝරාව |
|---|---|---|---|---|---|---|---|
| සැප්තැම්බර් | 06 | ඉරිද | 15.04-15.16 | සී සෑම | දකුණ | ගජ | බුධ |
| | 09 | බදද | 14.53-15.02 | සී සෑම | උතුර | ගජ | චන්ද්‍ර |
| | | | 14.52-15.02 | බිම් සැකසීම | උතුර | ගජ | චන්ද්‍ර |
| | 11 | සිකුරාද | 06.02-06.15 | පැල සිටුවීම | උතුර | සිංහ | සිකුරු |
| | | | 12.08-12.20 | වැට පිරීම | උතුර | සිංහ | රවි |
| | 23 | බදද | 06.06-06.12 | ඇට සිටුවීම | උතුර | දිවි | බුධ |
| | | | 09.01-09.13 | පොල් සිටුවීම | උතුර | දිවි | ගුරු |
| | | | 12.16-12.32 | වී වැපිරීම | උතුර | දිවි | සිකුරු |
| ඔක්තෝබර් | 01 | බ්‍රහස්. | 05.58-06.10 | වී වැපිරීම | උතුර | දිවි | ගුරු |
| | 10 | සෙන. | 12.09-12.21 | වැට පිරීම | දකුණ | සිංහ | චන්ද්‍ර |
| | 12 | සඳුද | 06.02-06.14 | බිම් සැකසීම | නැගෙනහිර | ගජ | සඳු |
| | 19 | සඳුද | 05.57-06.09 | වී වැපිරීම | නැගෙනහිර | සිංහ | චන්ද්‍ර |

- මාස (04) වී සඳහා ඔක්තෝබර් (ඉල්) මස පෙ.ව. 05.57 - පෙ.ව. 06.09 අතර තිබෙන නැකත ගත යුතු ය.

ඔක්තෝබර් මස 17 දින ඉල් මාසය ලබන නිසා එයින් ඉදිරියට වැපිරීමට උපදෙස් දීමට නොහැක. ජනවහරේ පැරැන්නන් පත්‍ර මාසය ලෙස හඳින්වූයේ ඉල් මාසයයි. මේ මාසයේ දී අධික වැසි ලැබේ. අකුණු ගසනු ලැබේ. අකුණුවලින් පසට එක්වන නයිට්‍රජන් උරා ගැනීම සඳහා ගොයම් පැලවී තිබිය යුතු ය.

*(සබරගමුව සහ රුහුණු විශ්වවිද්‍යාලයන්හි බාහිර කථිකාචාර්ය, ජාතික ගොවි සමුළුවේ සභාපති, ඇසිස්ට් ලංකා පදනමේ ජ්‍යෙෂ්ඨ උපදේශක ඇග්‍රැක් ආයතනයේ විධායක අධ්‍යක්ෂ පරිසරවේදී තිලක් කන්දේගම මහතාගේ දේශනයක් ඇසුරෙනි.)*

**සරත් විජයගුණවර්ධන**

අලෙවි සහකාර - ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරී (වැ.ආ.)

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා

පුහුණු කිරීමේ ආයතනය